ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,478 - 2026 පෙබරවාරි මස 27 සිකුරාදා - 2026.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව
සම්මත වූ පනත්	—
පනත් කෙටුම්පත්	—
ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම්	—
ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම්	—
ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන	—
දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්	—
වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම්	—
පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම්	—
පිස්කල් විකිණීම්	54
බූදල් නඩු පිළිබඳ දැන්වීම්	—
නීති අධ්‍යාපන සභාවේ දැන්වීම්	—
නොතාරිස් ලැයිස්තුව	—
විවිධ දැන්වීම්	59

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 06 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

එස්. ඩී. පාඩිකෝරාල,
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

53 - B 082767 — - (2026/02)
C 1 -

පිස්කල් විකිණීම්

කුරුණෑගල දිසා අධිකරණයේ දී ය

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
PQ 131/PBPQ
අංක 68, බෞද්ධාලෝක මාවත, කොළඹ 04.

සහ, දැනට :

එල්. ඕ. එල්. සී. ෆිනෑන්ස් පීඑල්සී,
(කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වර්ෂ 2022.03.31 දින එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් පීඑල්සී සමග ඒකාබද්ධ වීමෙන් පසු එල්.ඕ.එල්. සී. ෆිනෑන්ස් පීඑල්සී වශයෙන් පවත්වාගෙන යනු ලබයි.)
අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.
(සමාගමේ නව අංකය : පීබී 244 පීක්‍යූ)

.....පැමිණිලිකරු.

එදිරිව

01. අබ්දුල් හමීම් මොහොමඩ් සලීම්,
අම්හාරි එන්ටර්ප්‍රයිසස්,
අංක 172, මීගමු පාර, බමුණාවල, කුරුණෑගල.

02. මොහම්මදු ජලීල් මොහොමඩ් සිද්දීන්,
අම්හාරි එන්ටර්ප්‍රයිසස්,
අංක 172, මීගමු පාර, බමුණාවල, කුරුණෑගල.

03. මුහම්මදු කාසිම් නසීර්,
රත්මිටියාගොඩ බංගලාව, පතින්ගස්කොටුව, මහවිල.

04. මොහමඩ් සහබ්දීන් මොහොමඩ් නිසාම්,
අංක 409/3, මීගමු පාර, බමුණාවල.

.....විත්තිකරුවන්.

කොළඹ වාණිජ මහාධිකරණ
නඩු අංකය : HC/Civil/933/2018
ඇස්කීසි අංකය : 47/25

වර්ෂ 2024ක් වූ පෙබරවාරි මස 28 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව එකී 01, 02, 03, සහ 04 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයකර ගන්නට කියා නියම කළ රු. 26,743,558.98 ක මුදලක් සහ ඒ මත 2018.01.31 දින සිට මෙහි දින තෙක් පොළිය ද සහ ඉන් අනතුරුව සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත පොළිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා එකී 01 සහ 02 විත්තිකරුවන්ගේ නිශ්චල සහ චංචල දේපළ සහ ගෙවල්, ඉඩම්, බඩුමුට්ටු, අයවිය යුතු ණය හා බැරකම් තහනම් කිරීමෙන් හා අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබාගත යුතුය. තව ද, 01 සහ 02 විත්තිකරුවන් විසින් මෙම නඩුවේ ඇතුළත් කර ඇති සමථය ප්‍රකාරව රු. 100,000/- ක මුදලක් පැමිණිලිකරුට ගෙවා ඇති අතර එය අඩුකර අයකර ගැනීම සඳහා එකී නඩුවෙන් මා වෙත නිකුත්කර ඇති ඇස්කීසි බලය පිට ඉහත නම් සඳහන් වන 01 සහ 02 විත්තිකරුවන් වන අබ්දුල් හමීම් මොහොමඩ් සලීම් සහ මොහම්මදු ජලීල්, මොහොමඩ් සිද්දීන් යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියලු දේ කුරුණෑගල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2025 ක් වූ ඔක්තෝබර් මස 01 දින කර ඇති තහනමට යටත් ව,

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 27 දින ප. ව. 2.00 ට,

01 සහ 02 විත්තිකරුවන්ට අයත් මෙම දේපළ පිහිටා ඇති වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ අංක 650 ඉලුක්වෙල උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වලව්වත්ත සහ ඩෙසිවැලිවත්ත නැමති ඉඩම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ පිහිටීම.-

මෙම ඉඩම කුරුණෑගල මීගමුව පාරේ කුරුණෑගල නගරයේ සිට කි. මී. 3.9 ක් මීගමු පාරේ යන විට බමුණාවල හන්දියට මීටර් 400 ක් පෙරාතුව මෙම ප්‍රධාන මාර්ගයේ වම් පස මෙම දේපළ පිහිටා ඇත. එසේම මෙම දේපළ පිහිටි ඉඩම තුළ තට්ටු තුනක ගොඩනැගිල්ලක් තිබෙන අතර, කුරුණෑගල දෙස සිට පැමිණෙන විට ෆැමිලි මාට් යනුවෙන් නම් කරන ලද නාම පුවරුවක් දකින්නට ලැබේ.

ගෙවීමේ ක්‍රමය.-

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

(i) ගැණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ද,
(ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට (අ) අයකිරීම් ද,
(iii) විකුණුම් සඳහා වන සියලු වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහක (75%) මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ කෝරලේ, වැඋඩපිල්ලි හත්පත්තුවේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අංක 650 ඉලුක්වෙල උතුර, ග්‍රාම නිලධාරි වසමට අයත් ඉලුක්වෙල ගම පිහිටි, වලව්වත්ත සහ ඩෙසිවැලිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගොඩ්වින් ජයසූරියගේ අංක 143 සහ 1999.06.23 දින දරන පිඹුරේ පිඹුර ප්‍රකාර ලොට් 18 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 143 දරන සැලැස්මේ කැබලි අංක 09 සහ 10 ද, නැගෙනහිරට : අංක 143 පිඹුරේ කැබලි අංක 19 ද, දකුණට : පාර ද, බස්නාහිරට : අංක 143 පිඹුරේ කැබලි අංක 17 දරන කොටස යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (පර්. 15) විශාල ඉඩම හා ඒ තුළ ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද වේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 38/60 යටතේ ලියාපදිංචි වී ඇත.

පී. එම්. පොඩිමැණිකේ,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - කුරුණෑගල.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 23 දින දී ය.

02-409

කොළඹ දිසා අධිකරණයේ දී ය

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

1994 අංක 09 දරන පනතෙන් සංශෝධිත පරිදි 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 15 වගන්තිය, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 341 සහ 839 වගන්ති යටතේ කරනු ලබන ඉල්ලීමයි.

අබාන්ස් ෆිනෑන්ස් පී.එල්.සී.,
(කලින් අබාන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් සහ අබාන්ස් ෆිනෑන්ස් සර්විසස් ලිමිටඩ්)
අංක 400, ගාලු පාර, කොළඹ 03.

සහ, දැන්

අංක 456, ආර්. ඒ. ඩී. මෙල් මාවත,
කොළඹ 03.
(සමාගමේ නව අංකය පී. බී. 1015 පීකිව්)

.....පැමිණිලිකරු.

නඩු අංකය	:	DDR/244/15
වටිනාකම	:	රු. 3,095,332/09
ස්වභාවය	:	ණය මුදල් ආපසු අයකර ගැනීම
ඇස්කීසි අංකය	:	596/16

එදිරිව

01. අම්බල කන්දේ ගෙදර ප්‍රේමදාස,
අංක B 54/A, උඩමාකඩවර,
හිඟුල.

02. උඩහවත්තේ ගෙදර නන්දාවතී,
අංක B 54/A, උඩමාකඩවර,
හිඟුල.
(මියගොස්)

03. අම්බල කන්දේ ගෙදර නිරෝෂා සංජීවනී කුමාරි,
අංක B 54/A, උඩමාකඩවර,
හිඟුල.

.....1, 2 විත්ති ආදේශිත විත්තිකාර පෙත්සම්කාරිය.

වර්ෂ 2015 ක් වූ නොවැම්බර් මස 16 දින කොළඹ අතිරේක දිසා විනිසුරු ගරු අමාලි රණවීර මැතිණිය ඉදිරිපිට මෙම නඩුව සුදුස්සක් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබ, පැමිණිල්ල සහ ලේඛන කියවා බැලීමෙන් ද, ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අඩංගු සම්ප්‍රකාශ ගැන සෑහීමට පත් වීමෙන් ද පසු ආඥාකර තීන්දු ප්‍රකාශ කරන වගනම් රුපියල් 3,095,332/09 ක මුදලක් සහ රුපියල් 2,000,000/- ක මුදලක් මත වර්ෂ 2015 ක් වූ ජූලි මස 28 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් වර්ෂයකට 28% බැගින් පොළිය ද, ඊට පසු මෙකී දිනයේ සිට මුදල් සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් එම අනුපාතිකය මත පොළිය ද, නඩු ගාස්තු ද, විත්තිකරුවන් විසින් එක්ව සහ/හෝ වෙන් වෙන්ව පැමිණිලිකරුට ගෙවිය යුතු බවය. ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ ගෙවල්, ඉඩම්, බඩු, ණය සහ අයවිය යුතු ණය තහනමට ගෙන අවශ්‍ය නම් ඒවා විකිණීමෙන් අධිකරණයේ මේ තීන්දු ප්‍රකාශය මගින් එකී විත්තිකරුවන්ට විරුද්ධව එක්ව සහ/හෝ වෙන් වෙන්ව පැමිණිලිකරු විසින් අයකර ගැනීමට ඇති රුපියල් 3,095,332/09 ක මුදලක් සහ රුපියල් 2,000,000/- ක මුදලක් මත වර්ෂ 2015 ක් වූ ජූලි මස 28 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් වර්ෂයකට 28% බැගින් පොළිය ද, ඉන්පසු මෙකී දින සිට මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වනතෙක් එම අනුපාතිකය මතම පොළිය ද, ලබා ගන්නා ලෙස ද, මේ නෛසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත් කිරීමෙන් දින 30ක් ඇතුළත හෝ මේ අධිකරණය විසින් ඉඩදෙන යම් දීර්ඝ කරන කාලයක් ඇතුළත ඒ මුදල මේ අධිකරණය ඉදිරියට ගෙනෙන ලෙස ද, බස්නාහිර පළාතේ පිස්කල් විසින් ඒ දේපළ විකිණූ මුදල හෝ මුදල් සහ තැනැත්තා හෝ තැනැත්තන් පිළිවෙලින් මේ අධිකරණයට දන්වන ලෙස ද, බස්නාහිර පළාතේ පිස්කල් ට මෙයින් අණ කරනු ලැබේ. මේ නෛසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත්කළ පසු එය එම කාර්යය සඳහා අණ පත්‍රයක් ලෙස ක්‍රියාත්මක විය යුතු බවට ද, නියෝග කර ඇති බැවින් ද, එකී නියත තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුට ගෙවීම් කිරීමට ඉහත නම් සඳහන් විත්තිකරුවන් පැහැර හැර අපොහොසත් වී ඇති බවට ද, දන්වා තීන්දු ප්‍රකාශ කර ඇත. එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 01 වන විත්තිකරු (මියගොස්) ආදේශිත 1, 2 විත්ති ආදේශිත විත්තිකාර පෙත්සම්කාරියට අයත් පහත උපලේඛනයේ සවිස්තර ව දක්වා ඇති නිශ්චල දේපළ,

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 20 දින ප. ව. 1.00 ට,

ඉහත නම් සඳහන් 1 විත්තිකරු (මියගොස්) ආදේශිත 1, 2 විත්ති ආදේශිත විත්තිකාර පෙත්සම්කාරියගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ උඩමාකඩවර පිහිටි බක්මීගොල්ල වත්ත නැමති ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. සී. එස්. බරෙක්සාස් මහතා විසින් වර්ෂ 1941.12.16 දින මැන සාදන ලද අංක 1027 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම් වූ උතුරට : මාලඇල කම්බි වැටක් සමග ස්වභාවික වැට සහ කුරුවේ මූකලාන හේන ද, නැගෙනහිරට : කුරුවේ මූකලාන හේන සහ බක්මී ගොල්ල වත්ත ද, දකුණට : බක්මීගොල්ල වත්ත ද, බටහිරට : පිට ඇළ යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 05 යි, රූඩ් 3 යි, පර්චස් 26 (අ. 5, රූ. 3, පර්. 26) ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පලතුරු ආදී සියලු දේත් වේ. ප්‍රධාන මාර්ගයේ සිට ඉහත කී ඉඩමට ප්‍රවේශ වීමේ මාර්ග අයිතිය ද වේ. බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතා විසින් 2006.06.16 දින මැන සාදන ලද අංක 1915 හි පිඹුරේ ලොට් අංක 01 පිඹුරු පත් අංක 1027 නැවත මැන සාදා විස්තර කරන ලදී. නිරවුල්ව බෙදා වෙන් කරන ලද සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ උඩමාකඩවර පිහිටි බක්මීගොල්ල වත්ත නැමති ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතා විසින් 2006.06.16 දින මැන සාදන ලද පිඹුරු පත් අංක 1915 හි ලොට් 01 ට මායිම් වූ, උතුරට : කුරුලු මූකලාන ද, ගිණිකොණට : බක්මීගොල්ල වත්ත ද, නිරිතට : පිට ඇළ ද, වයඹට : මාල ඇල සහ බක්මීගොල්ල වත්ත යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් (අ. 5, රූ. 3, පර්. 28) ක් විශාල ඉඩම සහ එයට පිවිසීමේ මහනුවර ප්‍රධාන මාර්ගයේ සිට

රඹුක්කන දක්වා දිවෙන මාර්ගයේ සහ ඉහත කී ඉඩමට ප්‍රවේශ වීමේ මාර්ග අයිතිය ද, එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේ ද වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්තිරුව H 38/38 ලියාපදිංචි කර ඇත.

ගෙවීමේ ක්‍රමය.-

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතු ය.

02. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

එම්. ආර්. එන්. එච්. කරුණානායක,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මාවනැල්ල.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 13 දින දී ය.

02-443

කොළඹ දී පැවැත්වෙන සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කවුඩාන බටහිර (අංක 539/426) ග්‍රාම නිලධාරි කොට්ඨාසය ගල්කිස්ස ටෙරන්ස් ඇවනිව් හි වරිපනම් අංක 17/1 හි පිහිටා ඇති මිල්ලගහවත්ත *හෙවත්* ලියනබරන්ගියාවත්ත *හෙවත්* අම්බලන්වත්ත නැමති ඉඩම සඳහා බලයලත් මානක විල්ෆඩ් දන්තනාරායන මහතා විසින් මැන සම්පාදිත 1996 නොවැම්බර් මස 10 දිනැති අංක 2010 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක E1B දරන ඉඩම

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
(මින් පෙර මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී යනුවෙන් හැඳින්වුණු)
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

.....*පැමිණිලිකරු.*

එදිරිව

01. ප්‍රීමියර් වෝටර් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 17, ටෙරන්ස් මාවත, ගල්කිස්ස.

සහ

අංක 1067, 3 වන මහල, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

සහ

නඩු අංක	:	CHC/374/2014/MR
ස්වභාවය	:	උකස්
කාර්ය පටිපාටිය	:	සාමාන්‍ය
වටිනාකම	:	රුපියල් මිලියන 10යි
ඇස්කීසි අංකය	:	58/2025

සිරිසඳ එස්ටේට්,
පුවක්පිටිය, අවිස්සාවේල්ල.

02. මණ්ඩාඩිගේ වර්ණා මිලානි ප්‍රනාන්දු,
අංක 17/1, ටෙරන්ස් මාවත,
ගල්කිස්ස.

.....විත්තිකරුවන්.

කොළඹ දී පැවැත්වෙන සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව නඩුවේ ඇතුළත් කර ඇති වර්ෂ 2017ක් වූ දෙසැම්බර් 08 දිනැති තීන්දු ප්‍රකාශය අනුව ඉහත විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු පැමිණිල්ලේ ආයාචනයේ සඳහන් එනම්, රුපියල් පස් මිලියන දෙලක්ෂ එකොළොස් දහස් දෙසිය තිස්අටයි ශත විසි එක (රු. 5,211,238/21) ක මුදලක් හා 2014ක් වූ මැයි මස 08 දින දක්වා එකතු වූ පොළියෙන් රුපියල් තුන් මිලියන නවලක්ෂ නවදහස් තුන්සිය හැත්තෑ දෙකයි ශත පනස් අට (රු. 3,909,372/58) ක් සහ 2014 ක් වූ මැයි මස 09 දින සිට සම්පූර්ණයෙන් ගෙවීම කරන තෙක් එකී රුපියල් පස් මිලියන දෙලක්ෂ එකොළොස් දහස් දෙසිය තිස් අටයි ශත විසි එක (රු. 5,211,238/21) ක ප්‍රාග්ධන මුදල මත සියයට විසිපහ (25%) ක වාර්ෂික පොළී අනුපාතයට වැඩිදුර පොළියක් ගෙවීමට නියෝග කර ඇති හෙයින් ද,

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව වන දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කවුඩාන බටහිර (අංක 539/426) ග්‍රාම නිලධාරි කොට්ඨාසය ගල්කිස්ස ටෙරන්ස් ඇවනිව් හි වරිපනම් අංක 17/1, හි පිහිටා ඇති මිල්ලගහවත්ත *හෙවන්*ලියනබරන්ගියාවත්ත *හෙවන්*අම්බලන්වත්ත නැමති ඉඩම සඳහා බලයලත් මානක විල්ෆඩ් දන්තනාරායන මහතා විසින් මැන සම්පාදිත 1996 නොවැම්බර් මස 10 දිනැති අංක 2010 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක E 1 B දරන ඉඩම වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම දේපල පිළිබඳ වෙන්දේසිය,

වර්ෂ 2026 ක් වූ මාර්තු මස 27 දින පෙ. ව. 11.00 ට,

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

දේපළට පිවිසෙන මාර්ගය.-

කොළඹ කොටුවේ සිට ගාලු පාර ඔස්සේ දෙහිවල නගරයේ පිහිටි කනත්ත දක්වා ගොස් වමට හැරී ටෙරන්ස් ඇවනිව් හි මීටර් 50 ක දුරක් ගිය පසු වමට හැරී අඩි 10 ක පුද්ගලික පාරේ මීටර් 50 ක දුරක් පිහිටි වරිපනම් අංක 17/1 හි නිවස වේ.

වෙන්දේසියේ ගෙවීමේ ක්‍රමය.-

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා වෙත පහත දැක්වෙන පරිදි මුදල් ගෙවිය යුතු ය. සියළුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරවලින් පමණක් ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ.

01. සම්පූර්ණ විකුණුම් මුදලින් සියයට විසිපහක (25%) මුදලක් එවලේම මා වෙත ගෙවිය යුතුය. විකුණුම් මුදලේ ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

02. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ වන පිස්කල් ගාස්තු හා රජයේ ගාස්තු ද එම අවස්ථාවේදී ම මා වෙත ගෙවිය යුතුය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කවුඩාන බටහිර (අංක 539/426) ග්‍රාම නිලධාරි කොට්ඨාසය ගල්කිස්ස ටෙරන්ස් ඇවනිව්හි වරිපනම් අංක 17/1 හි පිහිටා ඇති මිල්ලගහවත්ත *හෙවන්*ලියනබරන්ගියාවත්ත *හෙවන්*අම්බලන්වත්ත නැමති ඉඩම සඳහා බලයලත් මානක විල්ෆඩ් දන්තනාරායන මහතා විසින් මැන සම්පාදිත 1996 නොවැම්බර් මස 10 දිනැති අංක 2010 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක E 1 B දරන ඉඩම සඳහා මායිම් උතුරට : ගාලු පාරේ වරිපනම් අංක 173/23 සහ 173/24 දරන ඉඩම, නැගෙනහිරට : E 1 C දරන ඉඩම, දකුණට : E 1 D දරන ඉඩම සහ බස්නාහිරට : කැබලි අංක E 1 A සහ E 1 D දරන ඉඩම් යන සතර මායිම් තුළ පිහිටි පර්චස්

හයයි දශම දෙකයි බින්දුවක (පර්. 6.20) විශාලත්වයකින් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද සමග වේ. මෙම ඉඩම දෙල්කඳ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 76/85 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත ඉඩම මතින් යෑම් ඒම් ආදී මාර්ග අයිතීන් සහ සියළුම පරවශතා අයිතීන් සමග වේ.

ඉහත කී ගල්කිස්ස, ටෙරන්ස් ඇවනිව් හි වරිපනම් අංක 17/1 හි පිහිටි ඉඩම සඳහා බලයලත් මානක විල්ෆඩ් දන්තනාරායන මහතා විසින් මැන සම්පාදිත 1996 නොවැම්බර් මස 10 දිනැති අංක 2010 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක E 1 D දරන ඉඩම සඳහා මායිම්, උතුරට : E 1 A, E 1 B සහ E 1 C, නැගෙනහිරට : E 1 B දරන ඉඩම සහ ටෙරන්ස් ඇවනිව් හි වරිපනම් අංක 19 දරන කැබලි අංක E 1 F ඉඩම දකුණට : ටෙරන්ස් ඇවනිව් සහ බස්නාහිරට : කැබලි අංක E 1 F සතර මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම අටයි හයක (3.86) විශාලත්වයකින් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද සමග වේ. මෙම ඉඩම සඳහා වූ මාර්ග පරවශ්‍යතා අයිතීන් ද සමග වේ. දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 92/121 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මෙම නඩුවේ ලිස්පෙන්ඩනය සහ තීන්දු ප්‍රකාශය පිළිවෙලින් දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 76/85, F 92/121 සහ E 157/36 දරන පත් ඉරුවල ලියාපදිංචි වී ඇත.

ප්‍රධාන රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 03 දින,
කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

02-445

විවිධ දැන්වීම්

නොතීසිය
(07 රීතිය)

බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය (කොළඹ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

වැලිසර, මීගමුව පාර, අංක 704 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන International Institute of Health Science (Private) Limited පිළිබඳ කාරණයේ දී ය.

සහ

2007 අංක 7 දරන සමාගම් පනතේ XII වන කොටසේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණයේ දී ය.

ඩීමෝ (පුද්ගලික) සමාගම,
අංක 65, ජේතවන පාර,
කොළඹ 14.

නඩු අංකය	:	HC (Civil) /75/2025 CO
ස්වභාවය	:	ගණන් බේරා වසා දැමීම
වටිනාකම	:	15,357,719.83
කාර්ය පටිපාටිය	:	සාමාන්‍ය

.....පෙත්සම්කරු.

බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය (කොළඹ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා,

ඩීමෝ (පුද්ගලික) සමාගම,
අංක 65, ජේතවන පාර,
කොළඹ 14.

විසින් 2025ක්වූ දෙසැම්බර් මස 23 දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2026 මාර්තු මස 30 දින එකී අධිකරණයේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥවරයෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණයහිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ දිනාලි ගුරුසිංහ,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 65, ජේතවන පාර, කොළඹ 14.

සටහන.- එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ එම අදහස ඉහත නම් සඳහන් නීතිඥ දිනාලි ගුරුසිංහ යන අය වෙත ලිඛිතව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතුය. පුද්ගලයන්ගේ නම් සහ ලිපිනය හෝ නීති ආයතනයක් නම් එහි නම සහ ලිපිනය හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, වර්ෂ 2026 ක් වූ මාර්තු මස 29 දින පස්වරු 6.00 ට පෙර ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

02-455

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.